# සිංහල




## 3 ශ්‍රේණිය

Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

# පාඩම - කතන්දර පොත් කියවමු.

## ක්‍රියාකාරකම 1

- ඔබ ළඟ ළමා කතන්දර පොත් හෝ එකතු කරගත් වෙනත් පොත්, පත්තර, සඟරා තිබේ නම්, ඒවා එක් ස්ථානයක පිළිවෙළකට සකස්කර තබන්න.
- ළමා කතන්දර පොත් ලැයිස්තු ගත කරන්න. (පොත්වල නම් ලියන්න)
- එම ලැයිස්තුව පොත් අසල ප්‍රදර්ශනය කර තබන්න.

## ක්‍රියාකාරකම 2

- ඔබ කියවීමට කැමති ම පොත රැගෙන කියවීම ආරම්භ කරන්න.
- සෑම දින ම කියවීම සඳහා යම් කාලයක් වෙන්කර ගෙන කියවීමෙහි නිරත වන්න.

## ක්‍රියාකාරකම 3

- පහත තොරතුරු සහිත කාඩ්පත් කිහිපයක් සකස් කරගන්න. එක් එක් පොත කියවා නිම කළ පසු එක් එක් කාඩ්පත බැගින් ගෙන අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න.

කතන්දර පොතේ නම - ................................................

කතුවරයා ගේ නම - ...................................................

කතන්දර පොතේ ඔබ කැමති ම අවස්ථාවක් සඳහන් කරන්න.

.....................................................................................

.....................................................................................

## ක්‍රියාකාරකම 4

- ක්‍රියාකාරකම 3ට අදාළ ව කාඩ්පත්වලට අංක යොදා කාඩ්පත් පැකට්ටුවක් නිර්මාණය කරන්න. වැඩි වැඩියෙන් කාඩ්පත් එකතු කරන්න.

අන්තර්ගතය : උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : ටී.ඒම්.ජී දුලාන් සංජීව, නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය, නුවරඑළිය

### ක්‍රියාකාරකම 5

- එක් එක් පොතෙහි ඔබ සිත් ගත් අවස්ථාවක් බැගින් චිත්‍රයට නඟන්න. (එක් පොතකින් එක් අවස්ථාව බැගින්) චිත්‍ර එකතුවක් පවත්වා ගෙන යන්න.

පාසල නැවත ආරම්භ කළ පසු ඔබ ගේ ගුරුතුමාට/ගුරුතුමියට මෙම ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන්න.